# 4 අකුරු පුරාණය

පූජ්‍ය කොත්මලේ අමරවංශ හිමියන් විසින් ලියන ලද "ලක්දිව සෙල්ලිපි" නමැති කෘතියේ තෝණිගල සෙල්ලිපිය පිළිබඳ ව දක්වා ඇති කරුණු ඇසුරෙන් සකස් කරගත් පාඩමකි. පැරණි ලංකාවේ භාවිත කළ බ්‍රාහ්මී අක්ෂර ක්‍රමය පැහැදිලි කරන මේ පාඩම, පැරණි අකුරුවල ස්වරූපය විදහා දක්වයි.

සෙල්ලිපි යනුවෙන් හැඳින්වෙන්නේ ගලේ කෙටූ ලියවිල්ලකි. ලංකාවේ නොයෙක් ප්‍රදේශවලින් සොයාගත් හාරදහසක් පමණ වූ සෙල්ලිපි අතරින් එක්දහස් හතලිස් අටක් සවිස්තර ව සංඛ්‍යා ලේඛනවලට රැගෙන තිබේ. මේ සියලු සෙල්ලිපි පිහිටි ස්ථාන අනුව ලෙන්ලිපි, ගිරිලිපි, ටැම්ලිපි, පුවරුලිපි, හා වෙනත් ලිපි ආදි වශයෙන් නම් කර, වර්ග කර ඇත. ගුහාලිපි, පර්වතලිපි, ස්තම්භලිපි, පදරලිපි ආදි වශයෙන් ද තවත් ආකාරයකට මේවා නම් කිරීමට හා වර්ග කිරීමට පුළුවන.

**ලෙන්ලිපි** ගල්ගුහාවල /ගල් ලෙන්වල සමහර විට ලෙන ඇතුළත කටාරම අසල කොටන ලද ලිපි, ලෙන් ලිපි ලෙස හැඳින්වේ. වෙස්සගිරිය, මිහින්තලේ, රිටිගල ආදි ස්ථානවල මේවා දැකිය හැකි ය.

**ගිරිලිපි** ගල්තලාවල /ගල් පර්වතවල කොටන ලද ලිපි ගිරිලිපි නමින් හඳුන්වනු ලැබේ. තෝණිගල, දඹුල්ල, සිතුල්පව්ව ආදි ස්ථානවල දක්නට ලැබේ.

**ටැම්ලිපි** ගල්ලෙන තුළට වැසි ජලය ගලා නොඑන ලෙස, ලෙන් දොරට උඩින්, ගල අද්දර බේරා ඇති ගැටිය සකසා සිටවූ ගල් කණුවල, ස්තම්භවල එක පැත්තක හෝ පැති කීපයක හෝ කොටවා ඇති ලිපි, ටැම්ලිපි නමින් හැඳින්වේ. මොරගොඩ, සොරබොර වැනි ස්ථානවල මෙම ලිපි කොටවා ඇත.

**පුවරුලිපි** පුවරුවක විලාසයෙන් සැකසූ ගල් ලැලිවල කොටවා ඇති ලිපි පුවරුලිපි හෙවත් පදර ලිපි ලෙස හැඳින්වේ. මිහින්තලය, වේවැල්කැටිය, ජේතවනාරාමය ආදි ස්ථානවල දක්නට ලැබේ.

මීට අමතරව ගල් ඔරු, පියගැට ආදි තැන්වල දක්නට ලැබෙන ලිපි සහ තඹ සන්නස්, රන් සන්නස් මෙහි ලා වෙනත් ලිපි ලෙසින් සැලකේ.

මෙරට සෙල්ලිපි ඉතිහාසය දෙවනපෑතිස් අවධිය දක්වා ඈතට විහිදෙයි (මිහින්තලේ කණ්ඨක චෛත්‍යයට කරන ලද පුද පූජා ආදිය පිළිබඳ සඳහන් ලිපිය). මේ ලිපි අතර මුල් වකවානුවේ සිට, හත් වන සියවස දක්වා ලියැවී තිබෙන ලිපි එක් ගණයකටත්, එතැන් සිට ලියැවී ඇති ලිපි තවත් ගණයකටත් ඒවායේ භාෂා ලක්ෂණ අනුව වෙන් කිරීමට පුළුවන. වර්තමාන සිංහල හෝඩිය අද පවතින තත්ත්වයෙන් ම පුරාණයේ නො පැවතිණි. ඒ ඒ වකවානු තුළ ක්‍රමයෙන් එය විකාශනය වෙමින් පැවතිණි. මේ පිළිබඳ තොරතුරු විමසීමේ දී


ඉහත සඳහන් කරන ලද සෙල්ලිපි අතිශයින් ම වැදගත් වෙයි. ඒවායෙහි එකල පැවැති අකුරුවල සංකේත ඒ අන්දමින් ම දැකිය හැකිවෙයි.

සිංහල අකුරුවල ආදි ම සංකේත බ්‍රාහ්මී අක්ෂර බව පැහැදිලි ය. සෙල්ලිපි විමසුමෙහි දී මුල් කාලීන ව පැවති අක්ෂරවල හැඩය හා විලාසය ද, එකල පැවති භාෂා ව්‍යවහාරය ද, ලිපිවල ආකෘතිය ද, යනාදි තොරතුරු හමුවේ.

මේ අතින් අපට බෙහෙවින් ආධාර වන සෙල්ලිපියකි, තෝණිගල සෙල්ලිපිය. වවුනියාවේ සිට හොරොව්පතානට යන පාරේ, හයවන සැතපුම් කණුවට සැතපුම් භාගයක් පමණ උතුරින් පිහිටි දකුණු තිලක්කුමලය ප්‍රදේශයෙහි තෝණිගල හෙවත් "නාගරගල" නමින් හැඳින්වෙන ගල්තලාව මත පිහිටි මේ ලිපිය ක්‍රිස්තු වර්ෂ හතර වන ශතකයේ මෙරට රජ කළ, (මහසෙන් රජතුමාගේ පුත්) සිරිමෙවන් රජුගේ කාලයේ ලියැවුණු ලිපියක් වශයෙන් පිළිගනු ලැබේ.

මේ ලිපිය එකල මෙරට ලේඛන ව්‍යවහාරය සඳහා භාවිත කෙරුණු බ්‍රාහ්මී අක්ෂරවලින් සමන්විත ය. මේ ලිපිය පළමු පේළියේ සිට හතර වන පේළිය තෙක් දිග අඩි නවයකින් ද, පහේ සිට දහසය පේළිය තෙක් දිග අඩි හතකින් ද, දහහත් වන පේළිය දිග අඩි දෙකකින් ද යුක්ත වේ. උස අඩි දහයකි.

**බ්‍රාහ්මී අක්ෂරවලින් යුතු සෙල්ලිපිය**



**තෝණිගල (නාගරගල) සෙල්ලිපිය**

පැරණි ලංකාවේ පැවති බැංකු ක්‍රමයක් පිළිබඳ තොරතුරු මේ ලිපියෙන් හෙළි වීම විශේෂත්වයකි. දේව නමැත්තකු "කලහුමනක නියමතනහි" හෙවත් කලහුමනක නම් වෙළෙඳ පොළෙහි වී උඳු මුං තැන්පත් කොට එහි පොලිය "යහිසපවය" වෙහෙරෙහි ආර්යවංශ උත්සවය පවත්වනු සඳහා වඩින සංඝයා වහන්සේට ප්‍රත්‍ය සම්පාදනය පිණිස පූජා කිරීම පිළිබඳ තොරතුරු මෙහි ඇතුළත් කර තිබේ.

**සෙල්ලිපි පෙළෙහි කොටසක්**

01. සි පුවිය මහසෙන මහරජහ පුත සිරිමෙකවණ අබමහරජහ වත ලෙගි
02 තක තිණවනක වසහි නකරහි උතුර පසහි කළහුමනක නියම තනහි සිය අ
03 වීය කිනියෙනි නිකත කඩුබලගමකෙහි වසනක අමෙති පහෙජ සිවය
04 හ පුත දෙවයහ යහිස පවය - නව වහෙරකෙහි දින අරියව-
05. ස වටවි .....

අර්ථ :

01 යහපතක් වේවා, පෘථිවීශ්වර (පෙර සිටි?) මහාසේන මහ රජුගේ පුත්‍ර ශ්‍රී මේඝවර්ණාභය මහරජු සේසත් නැගීමෙන් (රජ බවට පත් වීමෙන්)

02. තුන් වන වර්ෂයෙහි, නගරයේ උතුරු පාර්ශවයෙහි (පිහිටි) කළහුමනක නම් වෙළෙඳ ශ්‍රේණියෙහි (වෙළෙඳ නගරයෙහි) තම (ධනය)

03 වැය (වියදම්) කිරීමක් හෝ අඩු කිරීමක් නො කරන සේ පිහිටුවන ලද කඩුබලගම වසන ඇමති මඬුල්ලෙහි (කෙනෙකු වූ) සිවයගේ

04. පුත්‍ර දෙවයගේ, (දේවයා විසින්) යහිස පවය නම් අභිනව විහාරයට දෙන ලද ආර්යවංශ වෘත්තිය (හෙවත් ආරියවංශ උත්සවය සඳහා දෙන ලද දීමනාව නම්)

සිංහල භාෂා විකාශනය පිළිබඳ ව කරන භාෂා තත්ත්ව පරීක්ෂණයක දී මෙවැනි ලිපි ඉතා වැදගත් වනු නිසැක ය. එහෙත්, එක් යුගයකට අයත් එක් ලිපියකින් පමණක් භාෂාවක පරිණාමය පිළිබඳ පර්යේෂණයක් කළ නො හැකි බව ද මෙහි ලා සැලකිය යුතු ය.

පුරාවිද්‍යාව අනුව අක්ෂරවල පරිණාමය ද ඉතා වැදගත් ය. ඒ පිළිබඳ ව තෝණිගල ලිපියෙන් හෙළි වන කරුණු ඉතා අගනේ ය.

අ-ක-ර යන අකුරුවල ඍජු රේඛා නොමැති වීම, ක්‍රිස්තු වර්ෂ මුල් භාගයේ ඉඳහිට දක්නට ලැබෙන "ඉ කාරය" මෙහි ක්‍රම කීපයකට ලියා තිබීම, "උ" හා "ර" අතර ස්වල්ප වෙනසක් තිබීම, "ග" අක්ෂරය දෙයාකාරයකින් ලියා තිබීම, "ඩ" කාරය සිංහල ලිපියක පළමු වරට දක්නට ලැබීම ඒ වැදගත් කරුණු අතරින් කීපයකි. මේ කරුණු විමර්ශනය කිරීමේ දී දඹදිව පල්ලව අක්ෂරවලින් ආභාසය ලබා ඇති බව ද විද්වත්හු පිළිගනිති. න-ණ අක්ෂර විකාශනය වූ බව මෙන් ම එකල න-ණ භේදය පැවැති බව ද "ණ" කාරය ලියා ඇති ආකාරය සැලකීමේ දී පැහැදිලි වේ.

එකල මෙරට පැවති ආර්ථික තත්ත්වය ද කෘෂිකර්මාන්තයේ ස්වරූපය ද, භික්ෂූන් වහන්සේ සඳහා ප්‍රත්‍යය පහසුව සැලසූ විලාසය ද තෝණිගල ලිපියෙන් හෙළිදරව් වන්නේ ය. මෙසේ ඓතිහාසික තොරතුරු රැසක් සනාථ කරන තෝණිගල හෙවත් නාගරගල ලිපිය සුවිශේෂී වූ අගනා ලියවිල්ලක් වන අතර ඉපැරණි භාෂා මූලාශ්‍රයයක් ද වන්නේ ය.

# අමිශ්‍ර සිංහල හෝඩිය

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | එ | ඒ | ඔ | ඕ |
| ක | ග | ජ | | | |
| ට | ඩ | ණ | | | |
| ත | ද | න | | | |
| ප | බ | ම | | | |
| ය | ර | ල | ව | | |
| ස | හ | ළ | අං | | |

# නූතන සිංහල හෝඩිය

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |
| (අ)ං | (අ)ඃ | | | | |
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

**4.1 ක්‍රියාකාරකම 1**

i. සෙල්ලිපි යනු මොනවා ද ?
ii. සෙල්ලිපිවලින් ඇති ප්‍රයෝජන ලියන්න ?
iii. ටැම්ලිපි හා ගිරිලිපි අතර වෙනස කුමක් ද?
iv. තෝණිගල ලිපියේ අක්ෂර කුමන අක්ෂර වර්ගයට අයත් ද ?
v. අක්ෂර පරිණාමය පිළිබඳ ව තෝණිගල ලිපියෙන් හෙළිවන වැදගත් කරුණු මොනවා ද?
vi "පැරණි බැංකු ක්‍රමයක් ගැන තොරතුරු මේ සෙල්ලිපියෙන් හෙළි වේ." ඒ කෙබඳු බැංකු ක්‍රමයක් ලෙස ඔබ සිතන්නෙහි ද?

## 4.2 ක්‍රියාකාරකම 2

**අක්ෂර වින්‍යාසය ල, ළ භාවිතය**

මූර්ධජ 'ළ' කාරයෙන් පටන් ගන්නා වචන කීපයක් සිංහල භාෂාවෙහි දක්නට ලැබේ.

| | | | |
|---|---|---|---|
| උදා: | ළඟ | ළඳ | ළැව්ගින්න |
| | ළමයා | ළමිස්සි | ළය |
| ළිඳ | ළෙන්ගතු | ළහිරු | |
| ළඳරුවා | ළිප | | |

මූර්ජධ 'ළ' කාරය කිසි විටෙකත් හල් ව නො යෙදේ. එබඳු තැන්හි 'ල' යෙදේ. මූර්ධජ 'ළ' කාර දෙකක් එක් තැන යෙදෙන්නේ ද නැත.

දන්තජ හා මූර්ධජ 'ල' 'ළ' දෙක එක තැන යෙදෙන බොහෝ විට මූර්ධජ ළ යන්න මුලට යෙදේ.
වළලු, නළල, පළල,

සමූහයක් හඟවන **රළ, පෙළ, මුළ,** වැනි තැන්වල මූර්ධජ 'ළ' යෙදේ.
ගස් පෙළ, ළමා පෙළ, මුව රළ, තරු වැළ, මීන් රළ, සොර මුළ
එහෙත් සමූහවාචී කැල ශබ්දය මූර්ධජ 'ළ' නොගනී.
ස්ථානවාචී පොළ ශබ්දයේ ළකාරය (මූර්ධජ වේ)
උදා - දුම්රියපොළ

**ඟ, ඳ, ඹ** යන සඤ්ඤක අකුරුවලට මුලින් බොහෝ විට ම යෙදෙන්නේ මූර්ධජ 'ළ' කාරය යි.
සුළඟ, ළිඳ, බොළඳ, වෙළඹ

ස්වරයක් සහිත ව මූර්ධජ 'ළ' යන්නෙන් අවසන් වන පද රාශියක් ඇත:

| | | | |
|---|---|---|---|
| ඇසළ | ඉහළ | සැණකෙළි | කළු |
| උකුළ | එළවළු | කොටළු | කළ |
| පිරුළ | එළිපෙහෙළි | කවුළු | හුළ |

ධාතු ප්‍රකෘතිය 'ර' කාරයෙන් අවසන් වන ක්‍රියා පදවල අතීත කාල ක්‍රියා රූපයේ මූර්ධජ 'ළ' යෙදේ.

| ධාතු ප්‍රකෘතිය | | ක්‍රියාරූප |
|---|---|---|
| කර | - | කළේ ය, කළෝ ය, කළ |
| අතුර | - | අතුළේ ය, අතුළෝ ය, අතුළ |
| වපුර | - | වපුළේ ය, වපුළෝ ය, වපුළ |
| මර | - | මළේ ය, මළෝ ය, මළ |
| වදාර | - | වදාළේ ය, වදාළෝ ය, වදාළ |
| විචාර | - | විචාළේ ය, විචාළෝ ය, විචාළ |

### 4.3 ක්‍රියාකාරකම 3

**නිවැරදි අකුරු යොදා හිස්තැන් පුරවන්න.**

i. අඩා.....(ල,ළ)
ii. අ.....ත් (ලු,ළු)
iii. උකු.....(ල,ළ)
iv. ඉකි.....ය (ලි,ළි)
v. එ.....පත්ත (ලි,ළි)
vi. උ.....වස්ස (ලු,ළු)
vii. එ.....දෙන (ල,ළ)
viii. තොටුපො..... (ල,ළ)
ix. ක.....ඹනවා (ල, ළ)
x. කස.....(ල, ළ)
xi. කැ.....ය (ල,ළ)
xii. ගැ.....පෙන (ල,ළ)
xiii. ගො.....මුහුද (ල,ළ)
xiv. තලළු.....ලු (ල,ළ)
xv. තු.....(ල,ළ)
xvi. දො.....හ (ල,ළ)

**නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුත් පදය තෝරන්න.**

| | | |
|---|---|---|
| සුපතළ | - | සුපතල |
| වදාල | - | වදාළ |
| පිලිමල් | - | පිළිමල් |
| විචාලේ ය | - | විචාළේ ය |
| පිලිසකර | - | පිළිසකර |
| අළුයම | - | අලුයම |
| කළුපාට | - | කලුපාට |
| සිත්කලු | - | සිත්කළු |
| රැව්පිළිරැව් | - | රැව්පිලිරැව් |
| මැණික් පතළ | - | මැණික් පතල |

**භාෂා හුරුව**

01. **අක්ෂර වින්‍යාසය අනුව නිවැරදි වචනය තෝරන්න.**

i. සජ්ජායනා/සජ්ඣායනා
ii. කච්ඡපුට/කච්චපුට
iii. මජ්ජිම නිකාය/මජ්ඣිම නිකාය
iv. ඥානය/ඥාණය
v. අත්‍යවශ්‍ය/අත්‍යාවශ්‍ය
vi. ආන්‍යෝන්‍ය/අන්‍යෝන්‍ය
vii. සීඝ්‍රගාමී/ශීඝ්‍රගාමී
viii. ආශ්චර්යය/ආශ්චර්ය්‍ය
ix. ඓෙතිහාසික/ඓතිහාසික
x. අත්‍යලංකාර/අත්‍යාලංකාර

**වියරණ හුරුව**

**02 අකාරාදි පිළිවෙළට සකසන්න**

i. වෙස්සගිරිය, රිටිගල, වල්ලිපුරම්, මිහින්තලේ
ii. නිලගම, විහාරගල, මහරත්මලේ, මුරුතව
iii. තිඹිරිවැව, ලබුඇටබැදිගල, වේවැල්කැටිය, ජේතවනාරාමය
iv. ලෙන්ලිපි, ගිරිලිපි, පුවරුලිපි, ටැම්ලිපි
v. තෝණිගල, දඹුල්ල, සිතුල්පව්ව, වවුනියාව

**"ය" යංශය යෙදීම**

හල් අකුරකට පසුව යෙදෙන "ය" කාරය වෙනුවට "ය" යංශය ද යෙදේ.
* යංශය යෙදුණු පසු පෙර අකුරේ හල් සලකුණ ඉවත් වේ.
 උදාහරණ : විද්‍යුත්, කැල්කියුලේටරය
* "ර" කාරයට පසු ව යංශය නො යෙදේ.
 උදාහරණ : කාර්යාලය, මහාචාර්ය
* "ය" අකුර සමග "ය" යංශය බැඳී ඇති විට "ය" යංශය මත රේඵය යෙදිය හැකි ය.
 උදාහරණ : කාය්‍ය, සූය්‍යයා

**රේඵය සහ රකාරාංශය**

**වචනයක යෙදෙන "ර්" ශබ්දය වෙනුවට රේඵය ද යොදාගැනේ. ( ̊ )**

කර්මය - කර්‍මය  මාර්ගය-මාර්‍ගය

**හල් අකුරකට පසු ව යෙදෙන "ර" ශබ්දය මුල් අකුරට සම්බන්ධ කිරීමේ දී රකාරාංශය ( ු ) යෙදේ**

ප්‍රවීණ, බහුශ්‍රැත, ප්‍රාචීන, ප්‍රශ්න

## 4.4 ක්‍රියාකාරකම 4

01 මිශ්‍ර සිංහල හෝඩියේ හා අමිශ්‍ර සිංහල හෝඩියේ අක්ෂර අතර වෙනස සොයන්න.
02 ඝ, ඨ, ඡ, යන අකුරු යෙදී ඇති පද ලියා දක්වන්න.
03 මූර්ධජ අකුරු හා සඤ්ඤක අකුරු එකට යෙදුණු වචන ඔබේ පාඩම් ඇසුරින් සොයන්න.

## 4.5 පැවරුම

1. යංශය "ය" යෙදෙන පද ලැයිස්තුවක් සකස් කරන්න.
2. "අපේ පැරණි ලේඛන කලාව" යන මැයෙන් රචනයක් ලියන්න.

**සංකල්පනා**

භාෂාව යනු, මිනිසා දීර්ඝ කාලීන ජීවන අරගලය, සන්තතිය තුළ තමා ලත් දැනුම්, කුසලතා, හැකියා, ධාරිතා, වින්දන යනාදිය නිදන් කර තැබීමටත්, අන්‍යයන්ට සන්නිවේදනය කිරීමටත් තනාගත් උපකරණයයි.